# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1896/5 - 2015 ජනවාරි මස 05 වැනි සඳුදා - 2015.01.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල**
**පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත**
**(262 වන අධිකාරය වූ)**
**පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වගන්තිය යටතේ**
**පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ**
**සභික ධුරයේ පුරප්පාඩුව පිරවීම**

සාමාජිකත්වය අහෝසි වීම හේතු කොට ගෙන පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ සභික ධුරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

දේවමුණිගේ අසංක ප්‍රභාත් සිල්වා නම් වූ තනතුර දැරූ සභිකයා අයත් වන කඳුරට ජනතා පෙරමුණ නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයකු වශයෙන් තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ, ඒ පක්ෂයට අයත් ඒ පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තේරී පත් වීම සඳහා ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු නාමයෝජනා කිරීමට, ඉහත කී ආඥාපනතේ 65අ(2) වන වගන්තිය යටතේ මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඉහත කී ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු වන කරුපයියා පද්මනාදන් මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ තේරීම් භාර නිලධාරී මුදියන්සේලාගේ කුමුදු සමන් ශ්‍රී රත්නායක වන මම, 2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වන වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, කරුපයියා පද්මනාදන් මහතා පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

සමන් ශ්‍රී රත්නායක,
තේරීම් භාර නිලධාරී,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව.

2015 ජනවාරි මස 03 වන දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
මහනුවර.

01 - 539

1A - G 20835 — 20 (2015/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*